2024.12.09 අද පිටු 3

# නිවසට පැමිණෙන සංගණන නිලධාරීන්ට තොරතුරු ලබාදීමට බිය වෙන්න එපා

## - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න

**නවෝද්‍යා පවනි**

සංගණන කටයුතු සඳහා නිවස වෙත පැමිණෙන සංගණන නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු ලබාදීමට කිසිදු බියක් ඇති කරගත යුතු නොමැති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි. එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය පවසන්නේ, සංගණන කටයුතු සඳහා පැමිණෙන නිලධාරීන්ට ඇතැම් නිවාසවලින් තොරතුරු ලබානොදීමේ තත්ත්වයක් වාර්තා වී ඇති බවයි.

කෙසේ වෙතත් එම සංගණන කටයුතු දෙසැම්බර් මස 23 වැනි දිනෙන් අවසන් කිරීමට බලාපොරොත්තු වන බව අධ්‍යක්ෂ ජනරාල්වරිය සඳහන් කළාය.

මෙම තොරතුරු රැස්කිරීම ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන්නේ සංගණන අඥාපනත යටතේ පැවැරී ඇති බලතල අනුව බවත්, කිසිසේත්ම සැකයක් ඇති නොකරගත යුතු බවත්, පුද්ගලික මට්ටමේ තීන්දු ගැනීමට මෙම තොරතුරු භාවිත නොවන බවත් ඇය කීවාය. රටේ ඉදිරි අනාගතයට, ඉදිරි වසර 10 සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට, සැලසුම් සකස් කිරීමට අවශ්‍ය වෙන තොරතුරු මෙම සංගණනයෙන් ලබාදෙන බවත්, ගණන් ගැනීමේ අදියරෙහි කටයුතු දෙසැම්බර් 23 වනදායින් අවසන් වීමට සියලු කටයුතු සැලසුම් කර ඇති බවත් ඇය සඳහන් කළාය. දෙසැම්බර් 19 සංගණන දිනය ලෙස ප්‍රකාශයට පත්කර ගැසට් නිවේදනයක් ජනාධිපතිවරයා විසින් නිකුත්කර ඇති බවත්, ඒ අනුව ගණන් ගන්නා නිලධාරියෙක් සංගණනය සඳහා තොරතුරු රැස්කිරීමට ඔබේ නිවසට නොපැමිණියහොත් 1901 දුරකතන අංකය අමතා දැනුම් දෙන ලෙස සියලු දෙනාම දැනුවත් කරන බවත් ඇය ප්‍රකාශ කළාය.